රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 24/93 (III)

මගේ අංකය :-III/140එල්/100ටී/8(නාව)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත හා
පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

1996 අගෝස්තු මස 07 වැනි දින

සියළුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**වාහන ආනයනය කිරීම, අනුග්‍රාහාත්මක කොන්දේසි මත සැපයීම් හා උපදේශක සේවා අංශයෙන්, පාවිච්චි කරන ලද වාහන නිකුත් කිරීම සහ රජයේ වාහනවල අයිතිය නිලධාරීන්ට පැවරීම**

උක්ත මැයෙන් නිකුත් කරන ලද 1993.10.01 දිනැති අංක 24/93 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පාර්ලිමේන්තු හා පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

**02. I කොටස**

අනුග්‍රාහාත්මක කොන්දේසි මත අළුත් වාහන ආනයන කිරීම හා අවුරුදු තුනකට වැඩියෙන් පරණ නොවන වාහන ආනයනය කිරීම.

(අ) නියමයන් හා කොන්දේසි

| | | | |
|---|---|---|---|
| I. | වර්ගය | - | පැජරෝ ඉන්ටර්කූලර්, මර්සිඩීස්බෙන්ස් සහ බී.එම්.ඩබ්ලිව්.වැනි සුඛෝපභෝගී වාහන හැර, වෙනත් කවර හෝ මෝටර් වාහනයක් |
| II. | වටිනාකම | - | මි.ර.නැ.වටිනාකම (ඇමරිකන්) ඩොලර් 26,500 කට නොවැඩි වාහන (ඊට සමාන වටිනාකමක් ඇති වනසේ කවර හෝ ව්‍යාහාරික මුදලකින් ගණන් බැලිය හැකිය.) |
| III. | එන්ජින් ධාරිතාව | - | සීමාවක් නැත |
| IV. | සුදුසුකම් | - | ඉකුත් වසර 05 ක කාලය තුළදී කවර හෝ සහනදායී කොන්දේසි මත වාහනයක් ආනයනය කිරීම හෝ මිලදී ගැනීම කර නොමැති වත්මන් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්. |
| V. | තීරු ගාස්තු හා බදු | - | තීරු ගාස්තු, බදු සහ ගාස්තු පැනවීම රහිතව. |

**02. ක්ෂය වූ වටිනාකමේ පදනම මත වාහන මිළදී ගැනීම.**

**(අ) නියමයන් හා කොන්දේසි :**

| | | |
|---|---|---|
| I. වර්ගය | - | පැජරෝ ඉන්ටර්කූලර්, මර්සිඩීස්බෙන්ස්, බී.එම්.ඩබ්.වැනි සුඛෝපභෝගී වාහන හැර, වෙනත් කවර හෝ මෝටර් වාහනයක් |
| II. වටිනාකම | - | මි.ර.නැ.වටිනාකම (ඇමරිකන් ) ඩොලර් 26,500 කට නොවැඩි වාහන (ඊට සමාන වටිනාකමක් ඇති වනසේ කවර හෝ ව්‍යවහාරික මුදලකින් ගණන් බැලිය හැකිය.) |
| III. එන්ජින් ධාරිතාව | - | සීමාවක් නැත. |
| IV. සුදුසුකම් | - | පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් හෝ වෙනත් කවර හෝ තත්ත්වයකින් හෝ සැපයීම් හා උපදේශාත්මක සේවා ඒකකයෙන් ක්ෂය වූ වටිනාකමේ පදනම මත කිසිම අවස්ථාවක මෝටර් වාහනයක් මිළදී ගෙන නොමැති වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු. |
| V. තීරු ගාස්තු හා බදු | - | විශේෂ රේගු ගාස්තු හා පිරිවැටුම් බදු වශයෙන් රු. 2500/- ක් අය කළ යුතුය. |

**03. පළාත් සභා මන්ත්‍රීවරුන් විසින් තම මුදලින් වාහන ආනයනය කිරීම.**

| | | |
|---|---|---|
| I. වර්ගය | - | පැජරෝ ඉන්ටර්කූලර්, මර්සිඩීස්බෙන්ස්, බී.එම්.ඩබ්.වැනි සුඛෝපභෝගී වාහන හැර, වෙනත් කවර හෝ මෝටර් වාහනයක් |
| II. වටිනාකම | - | මි.ර.නැ.වටිනාකම (ඇමරිකන් ) ඩොලර් 26,500 කට නොවැඩි වාහන (ඊට සමාන වටිනාකමක් ඇති වනසේ කවර හෝ ව්‍යවහාරික මුදලකින් ගණන් බැලිය හැකිය.) |
| III. එන්ජින් ධාරිතාව | - | සී.සී. 2000 නොඉක්මවන පැට්රල් වාහන සහ සී.සී. 3000 නොඉක්මවන ඩීසල් වාහන. |
| IV. සුදුසුකම් | - | ඉකුත් වූ වර්ෂ 05 ක කාලය තුලදී කවර හෝ සහනදායී කොන්දේසි මත වාහනයක් ආනයනය කිරීම හෝ මිලදී ගැනීම කර නොමැති, වත්මන් පළාත් සභා මන්ත්‍රීවරුන්. |

04. ඉහත සඳහන් කොන්දේසි 1995 ජූනි මස 20 වන දින සිට අදාල වන අතර, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ පලාත් සභා මන්ත්‍රීවරුන් විසින්, මෝටර් වාහන ආනයනය කිරීම පිණිස 1995.06.20 දින හෝ ඊට පෙරාතුව ණයවර ලිපි විවෘතකර තිබේ නම්, වාහනයේ වර්ගය, එන්ජින් ධාරිතාව, වටිනාකම, තීරු ගාස්තු , බදු සහ සුදුසුකම් ආදිය සම්බන්ධයෙන් එකී කාලපරිච්ජේදය තුළදී බලපැවැත්වූ අංක 24/93 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ හා අදල අමාත්‍ය මණ්ඩල තීරණවල දක්වා ඇති කොන්දේසි එලෙසම බලපපවත්වනු ඇත. 10 වන පාර්ලිමේන්තුවට යලි තේරී පත් වූ නව වන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් විසින් වාහන ආනයන කිරීම සම්බන්ධ මි.ර.නැ. වටිනාකමෙන් 25% ක් ගෙවීම අත්හැර දැමීම, 1995.05.04 දින සිට අදල වේ. පලාත් සභා මන්ත්‍රීවරුන් විසින් වාහන ආයනයනය කිරීම වෙනුවෙන් ස මේ ආකාරයම නිදහස් කිරීමක් අදාල වේ. කෙසේ වුවද මි.ර.නැ.වටිනාකමෙන් 25% ක් දැනටමත් ගෙවා ඇත්නම් එකී මුදල් ආපසු ගෙවනු නොලැබේ.

05. වාහන සඳහා වන අනිකුත් කොන්දේසි අංක 24/93 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් පරිදි වේ.

06. වාහන සඳහා අත්සන් කළ යුතු ගිවිසුම සංශෝධනය කර ඇති අතර, එය ඇමුණුම් (අ) වශයෙන් යා කොට ඇත. අත්සන් කළ යුතු උකස් බැඳුම්කරය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/93 සඳහන් පරිදි වේ.

07. තීරු බදුවලින් නිදහස් කිරීම සඳහා නිර්දේශ කිරීම පිළිබඳ ආකෘති පත්‍රය සංශෝධනය කර ඇති අතර, එය ඇමුණුම් (ආ) වශයෙන් යා කොට ඇත.

අ.කලේ/(ආර්.එස්.ජයරත්න)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

ඇමුණුම (අ)

**මෝටර් වාහනයක් වෙනුවෙන් තීරුබදු අනුග්‍රහයක් පිරිනැමීම සඳහා වන ගිවිසුම - ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ <u>ගරු පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා</u>**

..................................................................................................................................................

යන ලිපිනයෙහි පදිංචි (මෙහි මින්මතු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා / පළාත් සභා මන්ත්‍රීවරයා යනුවෙන් හඳුන්වනු ලබන හා ව්‍යවහාර කරනු ලබන ) ........................................................................ එක් පක්ෂනයකටද, (සම්පූර්ණ නම)

මෙහි ''ලේකම්'' යන පදය හෙවත් පාඨය මෙහි යොද ඇති පරිද සහ පදගත සම්බන්ධය අනුව අවශ්‍ය වන්නාවූ හා පිළිගැනෙන්නා වූ පරිදි එම පාඨයට පාර්ලිමේන්තුවේ මහ ලේකම් / ............................................................ පළාත් සභාවේප්‍රධාන ලේකම් වශයෙන් ක්‍රියා කරන

..................................................................................................................................................

(සම්පූර්ණ නම)

සහ එකී තනතුර අදල අවස්ථාවහෙි දරණ අනුප්‍රාප්තිකයන්, උරුමක්කාරයන්, පොල්මංකාරයන් සහ අද්මිනිස්ත්‍රාසිකරුවන් ද අදල අවස්ථාවෙහි එම තනතුරේ වැඩබලන පුද්ගලයන් හෝ එම තනතුරේ කාර්යයන් ඉටු කරන අයවලුන් ද පිළිගැනෙන, අදහස් වන හා ඇතුළත් වන අතර (මෙහි මින්මතු ''රජය'' යනුවෙන් හඳුන්වනු ලබන හා ව්‍යවහාර කරනු ලබන ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සඳහා සහ වෙනුවෙන් මෙහිලා ක්‍රියා කරන පාර්ලිමේන්තුවේ මහ ලේකම් / ................................................ පළාත් සභා ප්‍රධාන ලේකම් වන (මෙහි මින්මතු ''ලේකම්'' යනුවෙන් හඳුන්වන ලබන හා ව්‍යවහාර කරනු ලබන) ...................................................... ..........................................................................................................අනෙක් පක්ෂයටද

(සම්පූර්ණ නම)

එක් වී එම දෙපක්ෂය විසින් සහ එම දෙපක්ෂය අතරේ සම්මත කරගෙන අත්සන් කරනු ලබන ගිවිසුමයි.

(අ) පාර්ලිමේන්තු / පළාත් සභා මන්ත්‍රීවරයා දැනට පාර්ලිමේන්තුවේ /................................................ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු /පළාත් සභා මන්ත්‍රීවරයක වන හෙයින්ද,

(ආ) මෙහි උපලේඛණයේ විස්තර සඳහන් වන වාහනය ආනයනය කිරීමේදී වාහන මත වන තීරු ගාස්තු හා බදු අත්හැර දැමීමේ අනුග්‍රහය ලබා දීමට රජය එකඟ වී ඇති හෙයින්ද,

(ඇ) ඉහත කී අනුග්‍රහය ඇතිව ආනයනය කරනු ලබන (මෙහි මින්පසු එකී වාහනය යයි හඳුන්වනු ලබන) මෝටර් වාහනය මෙම ගිවිසුමේ පාර්ශවකරුවන් දෙදෙනාම විසින් අන්‍යෝන්‍ය වශයෙන් පහත සඳහන් ප්‍රකාර ගිවිසගනු ලබන නියමයන් සහ කොන්දේසි අනුව පාවිච්චි කිරීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා / පළාත් සභා මන්ත්‍රීවරයා එකඟ වී ඇති හෙයින්ද,

දැන් මෙම ගිවිසුම සාක්ෂි දරණ පරිදි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා / පළාත් සභා මන්ත්‍රීවරයා ද, ලේකම් ද විසින් අන්‍යෝන්‍ය වශයෙන් පහත සඳහන් ප්‍රකාර මෙයින් ගිවිස ගනු ලැබේ.

I. එකී වාහනය වෙනුවෙන් ගෙවිය යුතු රේගුවේ තීරුබදු සහ වෙනත් බදු ආදියේ ප්‍රමාණය රුපියල් ................................................ (රු............................................................වන්නේය.

II. එකී වාහනය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා / පළාත් සභා මන්ත්‍රීවරයා විසින් ආනයනය කරනු ලැබේ.

III. එකී වාහනය ආනයනය කිරීම වෙනුවෙන් අයදුම්කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා / පළාත් සභා මන්ත්‍රීවරයා විසින් ගෙවිය යුතු වන රේගු බදු සහ වෙනත් බදුවලට සමාන වන රුපියල් .............................. ........................................................................ (රු...........) ක අනුග්‍රහයක් රජය විසින් ලබා දිය යුතුය.

IV. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා / පළාත් සභා මන්ත්‍රීවරයා විසින් එකී වාහනය සැලකිල්ලෙන් පාවිච්චි කළ යුතු අතර, එය මනා සහ නිසි තත්ත්වයෙන් ද, ක්‍රියාකාරී තත්ත්වයෙන්ද පවත්වාගත යුතුය.

V. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා / පළාත් සභා මන්ත්‍රීවරයා එකී වාහනයේ සහ එහි සෑම කොටසකම සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් වගකිව යුතු අතර, එහි සම්පූර්ණ සුරක්ෂිතභාවය පිළිබඳ වග බලා ගැනීම සඳහා සියළු පූර්ව උපාය මාර්ගයන් යෙදිය යුතුය.

VI. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා / පළාත් සභා මන්ත්‍රීවරයා විසින් භාණ්ඩාගාරයේ ලේකම්ගේ පූර්ව අනුමැතිය නොමැතිව මොනයම් හේතුවක් නිසා හෝ කිසිදු තැනැත්තෙකුට එකී මෝටර් වාහනය ණයට දීම, කුලියට දීම, බදු දීම, විකිණීම, උගස් තැබීම, බැහැරදීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීම හෝ අයිතියෙන් වෙන් වීම නොකළ යුතුය.

මෙම කොන්දේසි කවර හෝ අන්දමින් උල්ලංඝණය කරනු ලැබුවහොත් රේගු ආඥා පනතේ විධිවිධාන යටතේ වාහනය රාජසන්තක කරනු ලැබීමට යටත් වන්නේය.

VII. එකී වාහනය යම් හදිසි අනතුරකට භාජනය වුවහොත් හෝ සම්බන්ධ වුවහොත් එසේ නැතහොත් අලාභ හානියට පත්වුවහොත්, විනාශ වුවහොත් හෝ නැති වුවහොත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා /පළාත් සභා මන්ත්‍රීවරයා විසින් වහාම ඒ බව අදාල පොලිස් ස්ථානයට සහ අදාළ ලේකම්ට දැනුම් දිය යුතුය.

VIII. වාහනය ආනයනය කළ දින සිට වසර **05** කාල පරිච්ඡේදය තුළ පාර්ලිමේන්තුමන්ත්‍රීවරයා /පළාත් සභා මන්ත්‍රීවරයා විසින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ පූර්ව අනුමැතිය නොමැතිව එම වාහනයේ අයිතිය කිසිදු වෙනත් පුද්ගලයෙකුට නොපැවරිය යුතුය. එසේ පවරන අවස්ථාවකදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා / පළාත් සභා මන්ත්‍රීවරයා විසින් තීරු ගාස්තු බදු ආදිය සහ තමාට ලැබුණු අනුග්‍රහ වෙනුවෙන් රුපියල් ...........................................

.................................................(රු.............................) ක මුදලක් රජයට ගෙවිය යුතුය. මෙම කොන්දේසි කවර හෝ අන්දමින් උල්ලංඝනය කරනු ලැබුවහොත් රේගු ආඥා පනතේ විධිවිධාන යටතේ වාහනය රාජසන්තක කරනු ලැබීමට යටත් වන්නේය.

IX. මෙහි සඳහන් විධිවිධාන නිසි ලෙස පිළිපදින බවට වග බලා ගැනීම සඳහාත් මෙම ගිවිසුමේ විධිවිධාන යටතේ රජයට හිමිකම් ඇති සියළුම මුදල් නිසි පරිදි අයවන බවට වග බලා ගැනීම සඳහාත් වාහනය ආනයනය කරනු ලබන අවස්ථාවේදී ඒ සඳහා අත්හැර දමනු ලබන තීරු ගාස්තු සහ බදුවල අගය වන රුපියල් .................................................................................. (රු...........................................) ක මුදලකට එම වාහනය අවුරුදු 05 ක (පහක) පරිච්ඡේදයක් සඳහා රජයේ නමට උකස් කිරීම, එම වාහනය රේගු දෙපාර්තමේන්තුවේ නිශ්කාෂණය කර ගත්දින සිට දින තිහක් (30) තුල පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා / පළාත් සභා මන්ත්‍රීවරයා විසින් සිදු කළ යුතුය.

X. එම වාහනය සඳහා ලබා දෙන ලද තීරු ගාස්තු සහ බදු සහනයට නොඅඩු මුදලක් සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා / පළාත් සභා මන්ත්‍රීවරයා විසින් පූර්ණ සර්වග්‍රාහී රක්ෂණ ආවරණයක් ඉහත සඳහන් අවුරුදු 05 ක කාලපරිච්ඡේදය තුළදී ලබා ගත යුතුය.

XI. වාහනය ආනයනය කළ දින සිට අවුරුදු 05 කාලපරිච්ඡේදය ඉකුත්වීමට පෙර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා / පළාත් සභා මන්ත්‍රීවරයා සිය තනතුරෙන් ඉල්ලා විටක හෝ සිය ධූරය හැර යන විටක හෝ තනතුරෙන් පහ කරනු ලබන විට හෝ එම වාහනය ආනයනය කරන අවස්ථාවේදී අත්හැර දමනු ලැබූ තීරු ගාස්තු සහ බදු ආදිය ඔහු විසින් ප්‍රමානානුකූල පදනමක් මත ලේකම් වෙත ගෙවිය යුතුය.

XII. වාහනය තබා ඇති ස්ථානයේ ලිපිනය වෙනස් වුවහොත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා / පළාත් සභා මන්ත්‍රීවරයා විසින් ඒ බව ලිපිනය වෙනස් වූ දින සිට සතියක් ඇතුලත මෝටර් වාහන රෙජිස්ට්‍රාර්, භාණ්ඩාගාරයේ ලේකම්, රේගු අධ්‍යක්ෂ ජනරාල් අදාළ ලේකම් වෙත ද දැනුම් දිය යුතුය.

* <u>අදාළ පළාත් සභාවේ ප්‍රධාන ලේකම්</u> - මින් අදහස් කරනුයේ අදාළ පළාත් සභාවේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වශයෙන් රාජකාරි කටයුතු කරනු ලබන ප්‍රධාන ලේකම් වේ.

ඇමුණුම (ආ)

භාණ්ඩාගරයේ ලේකම්,
මහා භාණ්ඩාගාරය,
කොළඹ 01.

**අංක 24/93 (III) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 1995.07.09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ - ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ගරු පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා අනුග්‍රාහාත්මක නියමයන් මත ආනයනය <u>කළ වාහන තීරුබදු වලින් නිදහස් කිරීම සඳහා නිර්දේශ කිරීම.</u>**

අංක ..........................................දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාර අනුග්‍රාහාත්මක නියමයන් මත වාහනයක් ආනයනය කිරීම සඳහා (කාර්යාල ලිපිනය) ................................................ (තනතුර) ...................................... (නම) ................................................................ මහතා /මහත්මිය / මෙනවිය හිමිකම් ලබන බව සහතික කරමි.

ඔහු / ඇය විසින් ආනයනය කළ (වාහනය පිලිබඳ විස්තර)....................................................... ............................................. වාහනය සඳහා අදල තීරුබදු සහනය ලබා දිය යුතු බව නිර්දේශ කරමි.

මා හෝ මා වෙනුවට බලය ලත් නිලධාරියකු විසින් අංක ...................................................... දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාර වාහනය සම්බන්ධයෙන් අවශ්‍ය සියලු පසු විපරම ක්‍රියාමාර්ගය ගනු ලබන බවට ස්ථිර කරමි.

අවශ්‍ය කටයුතු සඳහා පහත සඳහන් ලිපි ලේඛණ මේ සමඟ එවමි.

I. ඉහත සඳහන් වාහනය ආනයනය කරන තැනැත්තා විසින් තීරුබදුවලින් නිදහස් කරන ලෙස ඉල්ලා ඔබ වෙත එවා ඇති ලිපිය.

II. ඉහත සඳහන් වාහනය සඳහා ආනයන සහ අපනයන පාලක විසින් නිකුත් කර ඇති ආනයන බලපත්‍රයේ පිටපතක්

III. ඉහත සඳහන් වාහනයේ ඉන්වොයිසියේ පිටපතක් ඇත්නම් එය.

(අත්සන, නම හා තනතුර)

**ඉහත සඳහන් උපලේඛණය**

**(මෝටර් වාහනයේ විස්තරය)**

**............................ මෝටර් වාහනය**

අ. වර්ගය හා මාදිලිය :-
ආ. බොඩියේ ස්වරූපය :-
ඇ. ඇන්ජිමේ අංකය :-
ඈ. චැසියේ අංකය :-
ඉ. ලියාපදිංචි වීමේ අංකය :-
ඊ. ඇතුළත් කර ඇති අතිරේක දේවල් :-
උ. උපකරණ හා උපාංග :-

මීට සාක්ෂි වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී/ පළාත් සභා මන්ත්‍රී සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සඳහා සහ වෙනුවෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම් / ....................................................... පළාත් සභාවේ ප්‍රධාන ලේකම් විසින් මෙම ලියවිල්ලට සහ මේ සමාන වූද එම දිනයෙන් යුක්තවූද තවත් පිටපත් දෙකකට වර්ෂ එක් දහස් නවසිය අනූ...............ක් වූ...................................... මස......................... වැනිදා වන මෙදින කොළඹ දී අත්සන් කරන ලදී.

..............................................................
පාර්ලිමේන්තු මන්ත්‍රී/ පළාත් සභා මන්ත්‍රී

................................................................
පාර්ලිමේන්තු මහ ලේකම් / අදාළ පළාත් සභාවේ ප්‍රධාන ලේකම් (ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය සඳහා සහ වෙනුවෙන්)

**සාක්ෂි :-**

1. අත්සන :
නම :
පදවිය :
ලිපිනය :
දිනය :

2. අත්සන :
නම :
පදවිය :
ලිපිනය :
දිනය :